Department of Education Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - අගෝස්තු - 1

සකස් කළේ- දිනූෂා මිය,ර/බඹරබොටුව විජයබා ම.වි.

ශ්‍රේණිය - 12

නිපුණතාව 5 - සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වය සැලකිල්ලට ගනිමින් ජාතික ගිණුම් සැකසීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 5.4 - නිෂ්පාදන ප්‍රවේශය යටතේ ද.දේ.නි.ඇස්තමේන්තු කරන ආකාරය හා ඒ ආශ්‍රිත සංකල්ප විග්‍රහ කරයි.

1. පහත ක්‍රියාකාරකම් දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් වේද නොවේද යන්න සඳහන් කරන්න.

   1.ගෘහනියකගේ ගෘහාශ්‍රිත සේවා
   2.සුපිරි වෙළෙඳසැලක විකිණීමට ඇති භාණ්ඩ
   3.ස්වේච්ඡා සංවිධානයක් ශ්‍රමදානයක් මගින් පාර දෙපස එළි කිරීම.
   4.නවතම මෝටර් රථයක් මිළදී ගැනීම.

2. 2020 වර්ෂයට අදාළව කිසියම් ආර්ථිකයක් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.(එකතු කළ අගයන් මූලික මිලට වේ.)

රු.මි.

| | |
|---|---|
| කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය | 8,000 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම් | 3,000 |
| කාර්මික කටයුතුවල එකතු කළ අගය | 15,000 |
| සේවා කටයුතුවල එකතු කළ අගය | 25,000 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ගෙවීම් | 5,000 |
| ප්‍රාග්ධන පරිභෝජන දීමනාව | 1,000 |
| භාණ්ඩ හා සේවා මත අය කරන බදු සහනාධාර | 2,000 |

   1. වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න.
   2. දළ ජාතික ආදායම ගණනය කරන්න.
   3. ශුද්ධ ජාතික ආදායම ගණනය කරන්න.
   4. ශුද්ධ දේශීය ආදායම ගණනය කරන්න.